# ලොව වටා පුවත් වියමන

## සැන්ජෝසෙයි-දුකයි

ඔක්තෝබර් මාසය ඓතිහාසික වශයෙන් ලෝකයේ වෙසෙස් අවධානයට ලක්වන්නේ දේශපාලනමය කාරණා මත වුවද ඉකුත් ඔක්තෝබර් මාසය පුරා ලෝක වාසී බහුතරයකගේ අවධානය වැඩි වශයෙන් දිනාගත්තේ ඍජු ලෙසටම දේශපාලනය හා නොබැඳි සිදුවීම්ය.

චිලි පතල් කම්කරුවන් ගලවා ගැනීමේ මෙහෙයුම ඔක්තෝබරයේ වැඩිම ජන අවධානයක් දිනාගත් සිදුවීම වශයෙන් සැළකිය හැකිය.  ඔක්තෝබර් 12 දින ලෝකවාසී බහුතරයකගේ ඇස් යොමුවී තිබුණේ චිලි රට දෙසටය. මාස දෙකකට අධික කාලයක් චිලියේ සැන්ජෝෂේ පතලේ සිරවී සිටි කම්කරුවන් 33 දෙනාගේ ජීවිත බේරාගැනීම සඳහා සිදුකළ මෙහෙයුම සාර්ථක කරමින් පළමුවෙන්ම ෆොරෙන්සියෝ ඇවාලස් නම් කම්කරුවා පතලෙන් ගොඩට ගත්තේ එදිනය. එතැන් සිට පැයකට එක් කම්කරුවෙක් බැගින් කම්කරුවන් සියළු දෙනාම පිටතට ගැනීමට ගලවාගැනීමේ මෙහෙයුම ක්‍රියාත්මක කළ කණ්ඩායම සමත්විය. අනතුරුව මේ කම්කරුවන් පිරිස සුපිරි තාරකා බවට පත්වූහ. විද්‍යුත් සහ මුද්‍රිත ජනමාධ්‍ය කම්කරුවන් ලුහුබදිමින් ඔවුන්ගේ පැටිකිරිය ලෝකයට බෙදා දෙන්නට දගලද්දී



ලෝකයේ දස දෙසින් සංචාර සහ විවේකී දින ගත කිරීම සඳහා ඔවුන්ට ආරාධනා ලැබෙන්නට පටන්ගත්තේ තොග පිටිනි.

දිවි ගලවාගෙන පතලෙන් ගොඩට පැමිණි කම්කරුවන් අතුරින් පස්දෙනෙකු ඔක්තෝබර් 20දා උතුරු චිලියේ කැල්වෙරා ප්‍රදේශයේ දේවස්ථානයකදී එකම මොහොතේ විවාහ පත්වූ අතර එය මෙන්ම ලොව පුරා වැඩි අවධානයක් දිනාගත් සිදුවීම් බවට පත්වූයේ මේ කම්කරුවන් පිරිස සහභාගී වූ සිදුවීම්ය.

සැන්ජෝසේ මෙහෙයුම කම්කරුවන්ගේ ජීවිත ගලවා දෙමින් එලෙස සන්තෝෂයෙන් අවසන් වුවද චීනයේ හෙනන් පලාතේ ගල් අඟුරු පතලක සිරවූ මෙවැනිම කම්කරුවන් පිරිසකට අත්වූයේ ශෝක ජනක ඉරණමකි. ඔක්තෝබර් 16 දා මෙම  ගල් අඟුරු පතලේ සිදුවූ ගෑස් කාන්දුවක් සමග ඇතිවූ පිපිරීමෙන් පතලේ ප්‍රවේශ මාර්ගය දැවැන්ත පස් කන්දකින් වැසී ගියේය. පිපිරීම සිදුවන විට 276 දෙනෙකු පතලේ වැඩ කරමින් සිටි අතර ඉන් 36 දෙනෙකු පතල තුළ සිරවූහ. මේ පිරිස ගලවා ගැනීම සඳහා දැරූ සියළු උත්සාහයන් ව්‍යර්ථ කරමින් ඔවුන් පතල තුළම ජීවිතක්ෂයට පත්වූ බව කියවෙන ශෝක ජනක නිවේදනය චීන බලධාරීන් විසින් ප්‍රකාශයට පත්කරනු ලැබුවේ ඔක්තෝබර් 19දාය.

ලෝකයේ ශ්‍රම බලකායෙන් 1%ක් පමණ පතල් කම්කරුවන් බවට වාර්තා වන අතර සිය රැකියාවේ යෙදී සිටියදී ඇතිවන අනතුරුවලින් වාර්ෂිකව මිය යන පතල් කම්කරුවන්ගේ ප්‍රතිශතය ඉන් 8% ක් බවද පැවසේ. සංඛ්‍යාත්මකව ගත් කළ එය 12 000ක් පමණ වන අතර එයින්ද වැඩි මරණ ප්‍රමාණයක් වාර්තා වන්නේ චීනයෙනි. එහෙත් පතල් කම්කරුවන්ගේ ජීවිත දෙස ලෝකයේ ඇස් විවර වන්නේ ඉතා අල්ප වශයෙනි. චීනයේ පතල් කම්කරුවන් දෙස යොමු නොවුණද ලෝකයේ ඇස් එරට දේශපාලනය දෙස යොමු කරවූ සිදුවීමක් බවට මෙවර නොබෙල් සාම ත්‍යාග ප්‍රදානය පත්වූයේ අනපේක්ෂිත අයුරිනි. 2010 නොබෙල් සාම ත්‍යාගය හිමිවූයේ චීන ජාතික මානව හිමිකම් ක්‍රියාකාරිකයෙකු වන පනස් හතර හැවිරිදි ලියු ෂියාබෝටය. ඒ බව නිවේදනය කොට මේ වන විට මාසයක පමණ කාලයක් ගතවී ඇතත් තමන්ට නොබෙල් සාම ත්‍යාගය හිමිව ඇති බව තවමත් ෂියාබෝ දන්නේදැයි කිව නොහැකිය. මන්ද නොබෙල් ත්‍යාගය හිමිවන විට ඔහු සිටියේ චීනයේ සුවිසල් බන්ධනාගාරයක අඳුරු කුටියක් තුළ බැවිනි.

## නොබෙල් ෂියාබෝ

ෂියාබෝ චීනයේ දේශපාලන වෙනසක් අපේක්ෂාවෙන් වසර දහයක පමණ කාලයක් තිස්සේ සාමකාමී අරගලයක නිරතව සිටි විශ්ව විද්‍යාල ආචාර්යවරයෙකි. චීනයේ නව දේශපාලන පෙරළියක් සහ නිදහස් වාතාවරණයක් ගොඩනැගීම සඳහා වන සිය ප්‍රතිපත්ති ප්‍රකාශය ප්‍රසිද්ධියට පත්කිරීමට සූදානමින් සිටියදී චීන රජය විසින් ඔහු අත් අඩංගුවට ගනු ලැබුවේ 2008 වසරේදීය. අනතුරුව චීන රජයට විරුද්ධව



කුමන්ත්‍රණ සහ විප්ලව කළ බවට ඔහුට එරෙහිව රාජ්‍ය විරෝධී චෝදනා ගොණු කරමින්





ශ්‍රීලාල් සෙනෙවිරත්න

අධිකරණය හමුවේ නඩු පැවරුණ අතර නඩු විභාගය අවසානයේ ඔහුට වසර 11ක සිර දඬුවමක් නියම කෙරිණ.

2009 වසරේ එලෙස දේශපාලන සිරකරුවෙකු ලෙස සිරගත කරනු ලැබූ ෂියාබෝට මෙවර නොබෙල් සාම ත්‍යාගය පිරිනැමෙන්නේ එවන් පසුබිමකය. නොබෙල් ත්‍යාගය ෂියාබෝට පිරිනමා ඇති බව දැන ගැනීමෙන් චීන රජය බෙහෙවින් කුපිත විය. මෙවර නොබෙල් සාම ත්‍යාගය පිරිනමා ඇත්තේ අපරාධකරුවෙකුට බවත් එය දැඩි අශ්ලීල ක්‍රියාවක් බවත් නිවේදනය කළ චීන රජය ෂියාබෝ සහ නොබෙල් ත්‍යාගය පිළිබඳ කිසිදු තොරතුරක් සිය රට වැසියන්ට දැනගැනීමට නොහැකිවන ලෙස එරට සියළු පරිගණක පද්ධතිවලින් ඒ පිළිබඳ තොරතුරු වාරණය කිරීමටද බාහිර කිසිම පුද්ගලයෙකුට ෂියාබෝ හමුවීමට නොහැකි වන සේ දැඩි මුරකාවල් යෙදීමටද පියවර ගත්තේය. නොබෙල් ත්‍යාගය හිමිව ඇති බව සිය සැමියාට දැන්වීමට බන්ධනාගාරය වෙත යමින් සිටි ෂියාබෝගේ බිරිය අතරමගදී අභිරහස් ලෙස අතුරුදහන් වූ ඇය චීන ආරක්ෂක අංශ විසින් අත්අඩංගුවට ගෙන නිවාස අඩස්සියට පත්කරනු ලැබ ඇති බව දැනගන්නට ලැබුණේ දින කීපයකට පසුවය.

## අධම දේශපාලනය

පරාජිතයා පසුපස හඹායමින් පලිගන්නා දේශපාලන භාවිතයේ තවත් අවස්ථාවක් ඉරාකයෙන් වාර්තා වූයේ ඔක්තෝබර් 27 දාය. සදාම් හුසේන් පාලන සමයේදී විදේශ ඇමැතිවරයා ලෙසත් උප අගමැතිවරයා ලෙසත් කටයුතු කළ ටරෙක් අසීස්ට විරුද්ධව වත්මන් ඉරාක ආණ්ඩුව පවත්වාගෙන ගිය නඩු විභාගයේ තීන්දුව එදින ප්‍රකාශයට පත්කෙරුණු අතර එමගින් ටරෙක්ට මරණ



දඬුවම නියම කරනු ලැබ තිබිණ. එක්සත් ජාතීන්ගේ සංවිධානය, රුසියාව මෙන්ම වතිකානුවද මෙම දඬුවම ක්‍රියාත්මක නොකරන ලෙස ඉරාක පාලකයන්ගෙන් ඉල්ලීම් කර තිබුණද මෙය ලියන මොහොත දක්වාත් ඒ ගැන ඉරාක පාලකයන්ගේ ප්‍රතිචාරය පළවී නොතිබිණ. ශ්‍රී ලංකාවේ 2010 ජනාධිපතිවරණයේ පරාජිත ප්‍රතිපක්ෂ අපේක්ෂක ජෙනරාල් සරත් ෆොන්සේකාද බරපතල දේශපාලන පලිගැනීමකට ගොදුරුව සිටින අතර ඔහු විසින් ජනාධිපතිවරණ ප්‍රතිඵලය අභියෝගයට ලක් කරමින් ඉදිරිපත් කරනු ලැබ තිබූ ජනාධිපතිවරණ පෙත්සම ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණය මගින් ගාස්තු රහිතවම නිෂ්ප්‍රභ කරනු ලැබුවේද ඔක්තෝබර් 29 දිනය. අගවිනිසුරුවරයාද ඇතුළුව ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරන් පත්කරනු ලැබ ඇත්තේ ජනාධිපති මහින්ද රාජපක්ෂ විසින් වීමත් ජනාධිපතිවරණ පෙත්සමේ වග උත්තරකරුද ජනාධිපතිවරයා වීමත් මෙහිදී නොසලකා හැරිය නොහැකි කාරණයකි.

ඔක්තෝබර් 20 දා ලෝකයේ කිතුනු ප්‍රජාවට සුවිශේෂී දිනයක් ලෙස ඉතිහාසයට එක්වූයේ 16වන පාප්වහන්සේ වතිකානයේ ශාන්ත පීතර චතුරශ්‍රයේදී එදින සිදුකළ විශේෂ නිවේදනයක් හේතුවෙනි. නිවේදනයෙන් ප්‍රකාශයට පත්කෙරුණේ කිතුනු සභාවට තෝරාපත් කර ගැණුනු නව කාදිනල්වරුන් 24 දෙනෙකුගේ නම්ය. ලෝකයේ විවිධ රටවලින් එම කාදිනල්වරුන් තෝරාපත්කර ගෙන තිබුණු අතර කොළඹ අගරදගුරු මැල්කම් රංජිත් පියතුමාගේ නමද ඒ අතර විය. එතුමා මෙතෙක් ලංකාවෙන් පත්වූ දෙවැනි කාදිනල්වරයාය. මුල්වරට ලංකාවෙන් තේරුණු කාදිනල්වරයා තෝමස් කුරේ පියතුමාය. ඒ මීට වසර 73කට ඉහතදීය.


## මිහි කත කම්පාවී

ගෙවුණු මාසයේ ලෝකයේ රටවල් ගණනාවකට ස්වාභාවික විපත්වලට මුහුණ පෑමට සිදුවිය. හයිටියේ කොළරා වසංගතය පැතිර ගියේය. රුසියාවේ අර්ධ ද්වීපයක ගිණි කඳු දෙකක් පුපුරා ගියේ ඔක්තෝබර් 29 දාය. ක්ලයිචෙව්ස්කායා සහ සිවේලූස් යන එම ගිණි කඳු පිපිරීමෙන් හටගත් අළු සහ දුම්වලා අඩි හතලිස් දහසක් පමණ ඉහළටත් කිලෝමීටර් ගණනක් දුරටත් පැතිර ගිය අතර ඒ හේතුවෙන් ගුවන් ගමන්වලට පවා බාධා ඇතිවිය. ඉන්දුනීසියාවටද ජලයෙන් මෙන්ම ගින්නෙන්ද විපත් පමුණුවනු ලැබූ මාසයක් බවට ඔක්තෝබර් මාසය පත්විය. ඉන්දුනීසියාවේ සුමාත්‍රා දූපතට බටහිර මුහුදු පත්ලේ හටගත් ප්‍රභල භූමි කම්පාවකින් සුලු වේලාවකට පසු පැන නැගුණ සුනාමි රළ උතුරු සහ දකුණු පෙගායි දූපත් යටකරගෙන ගලා ගියේ පුද්ගලයන් 343 දෙනෙකුට මරු කැඳවමින් සහ ලක්ෂ ගණනක් වටිනා දේපොළ විනාශ කරමිනි. රික්ටර් මාපකයේ 7.7 ක් ලෙස සටහන්ව තිබූ භූමිකම්පාව හටගැනීමෙන් පසු සුනාමි අනතුරු ඇඟවීම් නිකුත් කරනු ලැබ තිබුණද බලධාරීන් ප්‍රමාණවත් සැළකිල්ලකින් කටයුතු නොකිරීම හේතුවෙන් විනාශය දරුණු වූ බව වාර්තා විය. සුනාමියෙන් පසුදා ඉන්දුනීසියාවේ මෙරාපි ගිනි කන්ද පිපිරී යාමෙන් තවත් පුද්ගලයන් 32 දෙනෙක් ජීවිතක්ෂයට පත්වූ අතර 14 දෙනෙකු තුවාල ලබා තිබිණ.

## පෝල්ගේ සමුගැනීම

ලෝක කුසලාන පාපන්දු තරගාවලියත් ඊට සමාගාමීව ලෝකයේ අවධානය දිනාගත් 'පෝල්'ගේ අනාවැකි කීමත් සම්බන්ධයෙන් ඉකුත් ජූලි මාසයේ විශ්ව වියමනේ තැබුණු සටහන ඔබට මතකද ? මේ අනාවැකිකරුවා කෙරෙහි ලෝකවාසීන්ගේ අවධානය විශාල වශයෙන් යොමුවීමට හේතුව පෝල්ගේ අනාවැකි ටක්කෙටම හරි වීමත්, අනාවැකිකරුවා මනුෂ්‍යයෙකු නොව බූවල්ලෙකුවීමත්ය. මේ අනාවැකි කීම නිසා පෝල්ට මරණ තර්ජනවලට මුහුණ දීමට පවා සිදුවිය.

ජර්මනියට අවසන් තරගයටවත් සුදුසුකම් ලබන්නට නොහැකිවන බවට පෝල් පලකළ අනාවැකිය නිසා කුපිත වූ ඇතැම් ජර්මාණුවන් කියා තිබුණේ පොල් මරා කෑමට ගත යුතු බවය. මේ හේතුවෙන් පෝල්ට විශේෂ ආරක්ෂාවක් සැපයීමට පවා බාරකරුවන්ට සිදුවිය. එලෙස විශේෂ ආරක්ෂාවක් සහ



සැළකිලි ලබමින් ජර්මනියේ සී ලයිෆ් සෙන්ටර් නමැති මින් මැදුරේ ජීවත් වූ පෝල් ඉකුත් දිනෙක කිසිදු හැල හොල්මනක් නැතිව සිටිනු නිරීක්ෂණය කළ පෝල්ගේ බාරකරුවන්ට දැකගන්නට ලැබුණේ කාටත් රහසේම පෝල් සිය ජීවිතයෙන් සමුගෙන ඇති බවය. බූවල්ලන්ගේ පරමායුෂ අනුව පෝල් ස්වාභාවික මරණයකට උරුමකම් කියනුයේ තවත් වසර දෙකකට පමණ පසුවය. පෝල්ගේ මරණය අභිරහසක් වන්නේ එබැවිනි.


**සිසු නැණ පාදන මාස්ටර් ටියුටරිං ආයතනයේ නව ශාඛා තුනක් විවෘත වෙයි**



*Addresses of centres*

6
**Glen Waverly :**
No 36, Myrtle Street
Glen waverly 3105
Contact Ajith : 0430635335

**Werribee :**
260, Hogans Street, Hoppers Crossing. 3029
Sujeewa : 0425188292

Bundoora/Mill Park
41, Veronica Crescent, Mill park 3082
Contact Nihal Tel : 0425403105